# ජාතික ක්‍රීඩා අරමුදල

## මෙහෙවර ප්‍රකාශය

**ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්ය දීම , ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ආධාර සහ අනුබල දීම ජාතික ක්‍රීඩා අරමුදලේ මෙහෙවරයි.**

## දැක්ම

**ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම**

## නීතිමය පසුබිම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතින් ජාතික ක්‍රීඩා අරමුදල ස්ථාපිත කරනු ලැබීය. පනතට අනුව අරමුදලේ කාර්යයන් සඳහා රජයෙන් ලැබිය හැකි මුදල් විදේශ රටකින් ලැබෙන ආධාර මුදල්, යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා උත්සවයක් වෙනුවෙන් අනුග්‍රහය දැක්වීම පිණිස යම් ආයතනයකින් ලැබෙන මුදල්, යම් තැනැත්තෙකු විසින් පරිත්‍යාග වශයෙන් ලැබෙන මුදල්, වෙනයම් මාර්ගයකින් ලැබෙන මුදල් අරමුදලට බැරවිය යුතුය. අමාත්‍යවරයා විසින් නිශ්චය කරණු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩාවකට ධෛර්ය දීම, දියුණු කිරීම හා සංවර්ධනය සඳහා ද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන්ද, ආයෝජනය කිරීම සඳහා ද මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්ය සඳහා ද අරමුදලෙන් මුදල් ගෙවිය හැකිය.

# 2017 වර්ෂය සඳහා වාර්ෂික පාලන වාර්තාව

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

## නීතිමය පසුබිම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ අංක 22 සිට 27 දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාපිත කරනු ලැබූ ජාතික ක්‍රීඩා අරමුදල 2007 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. වාර්ෂිකව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම හා ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කර ගෙන අරමුදලේ කාර්යයන් කරගෙන යන ලදී.

## ජාතික ක්‍රීඩා අරමුදලේ කාර්ය භාර්ය

ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික ක්‍රීඩා අරමුදල මඟින් ශ්‍රී ලාංකේය ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා ක්‍රීඩාවට සම්බන්ධිත මානව සම්පත් වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයේ භෞතික හා වෙනත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පවතින ප්‍රතිපාදන යටතේ අරමුදල් ලබාදීම සිදු කරනු ලබයි.

වර්තමානයේ ක්‍රීඩා අරමුදල මඟින් මතු සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් අවස්ථානෝචිත පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

එනම් ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණ වෙනුවෙන් ක්‍රීඩකයන් හා පුහුණුකරුවන් වෙත අනුමත කර ඇති නිර්ණායකයන් යටතේ ගෙවීම් කිරීම, හඳුනාගත් නිර්ණායකයන් යටතේ මාසිකව ක්‍රීඩකයන් සඳහා සිදුකරන පෝෂණ දීමනා ගෙවීම්, ක්‍රීඩාවේ අභිවෘද්ධිය වෙනුවෙන් නිර්දේශිතව විශේෂිත ඉල්ලීම සඳහා දෙනු ලබන දීමනා, ජාතික මහා ක්‍රීඩා උළෙල සඳහා අනුග්‍රහය දැක්වීම, දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා කරනු ලබන ගෙවීම්, විශේෂිත වූ ක්‍රීඩා උත්සව සඳහා සිදු කරන තිළිණ ප්‍රදානයන්, විශේෂිත ප්‍රදානයන්(එනම් විශ්වවිද්‍යාල හා වෙනත් ආයතන සඳහා සිදුකරනු ලබන ක්‍රීඩා උත්සව වෙනුවෙන් ගෙවීම්, ක්‍රීඩකයන් විශ්‍රාම යාමේදී/ක්‍රීඩාවෙන් සමුගැනීමේ දී සිදු කරන ගෙවීම්, විශේෂිත ක්‍රීඩා උපකරණ ඉල්ලීම් සඳහා අනුග්‍රහය දැක්වීම්, දේශීය විදේශීය තරඟ වෙනුවෙන් විවිධ කණ්ඩායම් සඳහා කරන දීමනා ගෙවීම්, සානුකම්පිත හේතූන් මත ක්‍රීඩාවට සම්බන්ධ වූ පුද්ගලයන්ට සිදු කරන ගෙවීම් හා ක්‍රීඩාවේ සංවර්ධනය අපේක්ෂිතව සිදු කරනු ලබන වෙනත් ගෙවීම් වේ).

## ක්‍රීඩා සම්මේලන සඳහා ලබා දුන් මුදල්

විවිධ ක්‍රීඩා ඉසව් නියෝජනය කරනු ලබන ක්‍රීඩා සම්මේලනවලට ප්‍රතිපාදන මුදාහැරීමට ක්‍රියා කිරීම මගින් 2017 වර්ෂය තුල ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරග රැසකට ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගි කරවන ලදී. ක්‍රීඩා සම්මේලනවල ඉල්ලීම් සලකා අරමුදලෙන් ලබා දෙන ලද මුදල් ප්‍රමාණයන් පහත දක්වා ඇත.

| අනු අංකය | ක්‍රීඩා සම්මේලන | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | මාතර දිස්ත්‍රික් මළල ක්‍රීඩා සංගමය | 200,000.00 |
| 2. | ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමය | 504,000.00 |
| 3. | ක්‍රීඩා සමාජ | 381,500.00 |
| | **එකතුව** | **1,085,500.00** |

## ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මුදල් ආධාර ලබා දීම

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | ක්‍රීඩකයින් සඳහා පෝෂණ දීමනා (දැනට ක්‍රීඩා කරන) | 20,100,000.00 |
| 2. | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | 733,311.40 |
| 3. | ක්‍රීඩකයින් සඳහා වෛද්‍යාධාර | 1,050,000.00 |
| | **එකතුව** | **21,883,311.40** |

## පුහුණුකරුවන්ට වෛද්‍යවරුන්ට හා නිලධාරින්ට මුදල් ආධාර

ක්‍රීඩාවේ උන්නතිය සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දායකත්වයක් මෙන්ම පුහුණු කරුවන්ගේ හා නිලධාරින්ගේ කැපවීම අවශ්‍යතාවය හඳුනාගෙන එම පාර්ශවයන් සඳහා මුදල් ආධාර ලබා දීමට ජාතික ක්‍රීඩා අරමුදලේ සම්පත් යොදා ගන්නා ලදී. ඒ අනුව පුහුණුකරුවන්ට වෛද්‍යවරුන්ට හා නිලධාරින්ට දීමනා වශයෙන් මුදල් ආධාරත් විදේශ ගමන් සඳහා ගුවන් ටිකට්පත් ඇතුළු මුදල් ආධාර ලබා දීමත් සිදු කරන ලදී. විස්තර පහත දැක්වේ.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | වාර්තාකරුවන්ගේ විදේශ සංචාර | 83,500.00 |
| 2 | නිලධාරින්ගේ විදේශ සංචාර | 1,952,230.81 |
| | **එකතුව** | **1,992,144.78** |

## ක්‍රීඩා තරග වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම

2017 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුල පවත්වන ලද ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරග සඳහා වු ජාතික ක්‍රීඩා අරමුදලේ දායකත්වය පහත දක්වා ඇත.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | ජාතික මහ ක්‍රීඩා උළෙල ගෙවීම් | 8,796,050.00 |
| 2. | ජාත්‍යන්තර තරඟ | 32,500.00 |
| | | |
| | **එකතුව** | **8,828,550.00** |

## පිළිගැනීම් සහ උපහාර

ජාතික හා ජාත්‍යන්තර තරඟ වලදි විශේෂ දක්ෂතා පෙන්වා රටට කීර්තියක් ලබා දී දැනට විශ්‍රාම සුවයෙන් සිටින හා දැනටත් ක්‍රීඩාවේ සක්‍රීයව සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් උපහාර පිදීම හා විශිෂ්ඨ ජයග්‍රහණ ලබා මවු බිමට පැමිණෙන අවස්ථා වලදී ගෞරවාන්විත පිළිගැනීමක් ලබාදීම සඳහාත් පියවර රැසක් ගැනීමට 2017 වර්ෂය තුලදී ක්‍රියා කරන ලදී. ඒ සඳහා ලබා දුන් මුදල් හා දරන ලද වියදම් පහත දක්වා ඇත.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | ක්‍රීඩකයින් සඳහා උපහාර | 24,215,500.00 |
| | **එකතුව** | **24,215,500.00** |

## වෙනත් වියදම්

2017 වර්ෂය තුල ජාතික ක්‍රීඩා අරමුදලින් ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ අනුමැතිය මත දරන ලද අනෙකුත් වියදම් විස්තර පහත දැක්වේ.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | විවිධ වියදම් | 8,122,633.00 |
| 2 | පරිපාලන වියදම් | 657,677.00 |
| 3 | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය සඳහා වියදම් | 3,484,761.09 |
| 4 | වෙනත් දීමනා | 600,000.00 |
| | **එකතුව** | **12,865,071.09** |

## 2017 වර්ෂය තුල ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා

ශ්‍රී ලාංකීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තරඟවල දී ලබාගත් පදක්කම් පිළිබඳ සටහනක් පහත දක්වමි. මෙම දක්ෂතා ප්‍රදර්ශනය කිරීම සඳහා ජාතික ක්‍රීඩා අරමුදලෙන් විශේෂිත දායකත්වයක් ලබා දීමට හැකි විය.

| අංකය | ක්‍රීඩාව | තරඟාවලිය | පැවැත් වූ රට | පදක්කම් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | රන් | රිදී | ලෝකඩ | එකතුව |
| | | | | | | | |
| 1 | මීටර් 100 | බෘනායි විවෘත මලල ක්‍රීඩා තරඟාවලිය | බෘනායි | 1 | – | 1 | 2 |
| 2 | මීටර් 200 | | | 1 | – | – | 1 |
| 3 | මීටර් 400 කඩුලු පැනීම | | | 1 | – | – | 1 |
| | | | | | | | |
| 4 | මීටර් 800 | | | 1 | – | – | 1 |
| 5 | දුර පැනීම | | | 1 | – | – | 1 |
| 6 | කබඩි | අන්තර්ජාතික වෙරළ කබඩි තරඟාවලිය | මුරුසි | 1 | – | – | 1 |
| 7 | පිහිණුම් මීටර් 50 නිදහස් ආර | 06 වැනි යොවුන් පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟාවලිය | බහමාස් | – | 1 | – | 1 |
| | | | | – | 1 | – | 1 |
| 8 | පිහිණුම් | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | මීටර් 100 නිදහස් ආර | | | | | | |
| 9 | කරාතේ | 04 වැනි දකුණු ආසියානු කරාතේ ශුරතාවය | ශ්‍රී ලංකාව | 21 | 33 | 8 | 62 |
| 10 | හෙල්ල විසි කිරීම | ලෝක පැරා මලල ක්‍රීඩා තරඟාවලිය | ලන්ඩන් | _ | 1 | _ | 1 |
| 11 | මීටර් 800 | 05 වැනි ආසියානු ගෘහස්ථ මලල ක්‍රීඩා තරඟාවලිය | ටර්ක්මෙනිස්තාන් | 1 | 1 | _ | 2 |
| 12 | උස පැනීම | | | _ | _ | 1 | 1 |
| 13 | දුර පැනීම | | | _ | 1 | _ | 1 |
| 14 | කාය වර්ධන | 51 වන ආසියානු කායවර්ධන තරඟාවලිය | කොරියාව | 1 | _ | _ | 1 |
| | | | | | | | |
| 15 | බර ඉසිලීම | පොදු රාජ්‍ය මණ්ඩලීය බර ඉසිලීමේ තරඟාවලිය | ඕස්ට්‍රේලියාව | _ | 1 | 1 | 2 |
| | **එකතුව** | | | **29** | **39** | **11** | **79** |

# කෘතඥතාව

ජාතික ක්‍රීඩා අරමුදලේ කටයුතු කරගෙන යාමේදී ගරු ක්‍රීඩා ඇමතිතුමාගේ,ක්‍රීඩා අමාත්‍යාංශ නිලධාරින්ගේ හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ සහභාගිත්වය ඉතා අගය කොට සලකමි.

ඩබ්ලිව්.ඒ.චූලානන්ද පෙරේරා
ලේකම්
විදුලි සංදේශ,විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය

## ජාතික ක්‍රීඩා අරමුදල
## 2017-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ගිණුම

| ලැබීම් 2016 | කෝඩ් අංක 1 | කෝඩ් අංක 2 | කෝඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තරය | ගිණුම් සටහන් | ලැබීම් 2017 | ලැබීම් 2017 |
|---|---|---|---|---|---|---|---|
| රු. ශත | | | | | | රු. ශත | රු. ශත |
| 6,114,474.86 | | | | ජනවාරි 01 දිනට ශේෂය | | | 11,860,219.49 |
| 63,312,569.40 | 011 | 000 | 00 | ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | | 5,000,000.00 | |
| 1,861,586.31 | 020 | 000 | 00 | ස්ථාවර තැන්පතු පොළී | | 2,405,730.40 | |
| 49,000,000.00 | 041 | 000 | 00 | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | | 29,000,000.00 | |
| | 042 | 002 | 00 | විවිධ ලැබීම් - ශක්ති වර්ධන ශාලාවේ ලැබීම් | | | |
| 10,000,000.00 | 001 | 000 | 00 | ප්‍රදාන | | 19,500,000.00 | |
| 75,000.00 | 060 | 000 | 00 | විවිධ තැන්පත් | 08 | 5,458,334.00 | |
| | 064 | 000 | 00 | වැය ශීර්ෂ වලට බැර | | 19,712.00 | |
| 364,600.00 | 066 | 001 | 00 | ගෙවීම් ආපසු ලැබීම් | 01 | 185,186.50 | |
| 52,330.14 | | | | WHT ලැබීම් | | | |
| | 065 | 000 | 00 | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | | 4,975,885.22 | |
| | 066 | 000 | 000 | වෙනත් ආදායම් | | 1.00 | |
| | | | | | | | 66,544,849.12 |
| 130,780,560.71 | | | | ලැබීම් එකතුව | | | 78,405,068.61 |
| 2016 ගෙවීම් | | | | | | 2017 ගෙවීම් | 2017 ගෙවීම් |
| 429,926.03 | 021 | 000 | 00 | ජාත්‍යන්තර තරඟ | | 32,500.00 | |
| 360,000.00 | 026 | 000 | 00 | පරිපාලන වියදම් | | 657,677.00 | |
| 600,000.00 | 027 | 002 | 00 | වෙනත් දීමනා | | 600,000.00 | |
| 370,700.00 | 028 | 000 | 00 | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | | 733,311.40 | |

| ලැබීම 2016 | කෝඩ් අංක 1 | කෝඩ් අංක 2 | කෝඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තරය | ගිණුම් සටහන් | ලැබීම 2017 | ලැබීම 2017 |
|---|---|---|---|---|---|---|---|
| | 029 | 000 | 00 | වාර්තාකරුවන්ගේ විදේශ සංචාර | | 83,500.00 | |
| 6,215,000.00 | 033 | 000 | 00 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | | 20,100,000.00 | |
| 15,000.00 | 037 | 000 | 00 | ක්‍රීඩකයින් සදහා වෛද්‍යාධාර | | 1,050,000.00 | |
| 95,785,850.01 | 038 | 000 | 00 | ක්‍රීඩකයින් සදහා උපහාර | | 24,215,500.00 | |
| 750,000.00 | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් රග්බි පාපන්දු සංගමය | | | |
| 150,000.00 | 040 | 035 | 00 | සමස්ථ ලංකා කරාතේ සංගමය | | | |
| | 040 | 035 | 00 | ක්‍රීඩා සමාජ | | 381,500.00 | |
| | 040 | 035 | 00 | මාතර දිස්ත්‍රික් මළල ක්‍රීඩා සංගමය | | 200,000.00 | |
| | 040 | 035 | 00 | ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමය | | 504,000.00 | |
| 7,294,500.00 | 046 | 005 | 00 | ජාතික  මහ ක්‍රීඩා උළෙලට ගෙවීම් | | 8,796,050.00 | |
| 6,249,365.18 | 047 | 000 | 00 | විවිධ වියදම් | | 8,122,633.00 | |
| 700,000.00 | 063 | 001 | 00 | ජනාධිපති සම්මාන | | | |
| | 060 | 001 | 00 | විවිධ තැන්පත් | | 2,158,884.00 | |
| | 065 | 002 | 00 | ඉන්ධන අත්තිකාරම් | | 15,000.00 | |
| | 065 | 003 | 00 | අලාභ හානි අත්තිකාරම් | | 39,666.00 | |
| | 065 | 004 | 00 | විවිධ අත්තිකාරම් | | 226,826.10 | |
| | 065 | 001 | 00 | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය - වියදම් | | 3,484,761.09 | |
| 118,920,341.22 | | | | එකතුව | | | 71,401,808.59 |
| 11,860,219.49 | | | | දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය | | | 7,003,260.02 |

**ජාතික ක්‍රීඩා අරමුදල**

**2017-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම**

| කෝඩ් අංක 1 | කෝඩ් අංක 2 | කෝඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තර | ගිණුම් | හර | බැර |
|---|---|---|---|---|---|---|
| | | | | සටහන් | රු.ශත | රු.ශත |
| 002 | 000 | 00 | සමුච්චිත අරමුදල 2017.01.01 දිනට | | | 165,778,042.90 |
| 011 | 000 | 00 | ආයෝජන ගිණුම 2017.12.31 දිනට | | 142,760,514.45 | |
| 013 | 000 | 00 | ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී 2017.12.31 දිනට | 05 | 6,500,371.24 | |
| 013 | 000 | 00 | ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී 2016.12.31 දිනට | | 9,698.37 | |
| 017 | 000 | 00 | ලැබිය යුතු ආදායම්- ජාතික ලොතැරැයි මණ්ඩලය | 06 | 8,054,718.97 | |
| 020 | 000 | 00 | ස්ථාවර තැන්පත් ආයෝජන පොලී | 04 | | 14,792,802.70 |
| 021 | 000 | 00 | ජාත්‍යන්තර තරඟ | | 32,500.00 | |
| 026 | 000 | 00 | පරිපාලන වියදම් | | 657,677.00 | |
| 027 | 002 | 00 | වෙනත් දීමනා | | 600,000.00 | |
| 033 | 000 | 00 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | | 20,400,000.00 | |
| 037 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා වෛද්‍යාධාර | | 1,050,000.00 | |
| 038 | 000 | 00 | ක්‍රීඩකයින් සඳහා උපහාර | | 24,185,500.00 | |
| 028 | 000 | 00 | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | | 733,311.40 | |
| 029 | 000 | 00 | වාර්තාකරුවන්ගේ විදේශ සංචාර | | 83,500.00 | |
| 040 | 035 | 00 | ක්‍රීඩා සමාජ | | 381,500.00 | |
| 040 | 035 | 00 | ශ්‍රී ලංකා ඔලිම්පියන්ස් සංගමය | | | |
| 040 | 035 | 00 | ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමය | | 504,000.00 | |
| 040 | 035 | 00 | මාතර දිස්ත්‍රික් මළල ක්‍රීඩා සංගමය | | 200,000.00 | |

| කෝඩ් අංක 1 | කෝඩ් අංක 2 | කෝඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තර | ගිණුම් | හර | බැර |
|---|---|---|---|---|---|---|
| 041 | 000 | 00 | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 06 | | 24,551,128.97 |
| 043 | 000 | 00 | විගණන ගාස්තු ගෙවීම | | 180,000.00 | |
| 043 | 001 | 00 | විගණන ගාස්තු වෙන්කිරීම | 07 | | 540,000.00 |
| 046 | 005 | 00 | ජාතික ක්‍රීඩා උළෙලට ගෙවීම් | | 8,796,050.00 | |
| 047 | 000 | 00 | විවිධ ගෙවීම් | | 8,122,633.00 | |
| 050 | 000 | 00 | මුදල් ශේෂය | | 7,003,260.02 | |
| 060 | 000 | 00 | විවිධ තැන්පතු | 08 | | 3,327,564.00 |
| 066 | 000 | 00 | ගෙවීම් ආපසු ලැබීම් | 01 | | 185,186.50 |
| 001 | 000 | 00 | ප්‍රදාන | | | 19,500,000.00 |
| 038 | 000 | 00 | පෝෂණ දීමනාව-ගෙවිය යුතු | | | 300,000.00 |
| 066 | 000 | 00 | වෙනත් ආදායම් | | | 1.00 |
| 064 | 000 | 00 | වැය ශීර්ෂ වලට බැර | | | |
| 011 | 001 | 00 | ආයෝජන ආදායම් ගැලපීම් ගිණුම | | | 4,278.35 |
| 065 | 002 | 00 | ඉන්ධන අත්තිකාරම් | | 6,000.00 | |
| 065 | 004 | 00 | විවිධ අත්තිකාරම් | | 214,809.10 | |
| 065 | 001 | 00 | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය - වියදම් | | 3,868,907.72 | |
| 065 | 000 | 00 | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය -ලැබීම් | | | 5,158,385.22 |
| 065 | 002 | 00 | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය - ගෙවිය යුතු වියදම් | | | 390,061.63 |
| 065 | 000 | 00 | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය -ලැබිය යුතු ආදායම් | | 182,500.00 | |
| | | | | | 234,527,451.27 | 234,527,451.27 |

**ජාතික ක්‍රීඩා අරමුදල**

**2017-12-31 දිනෙන් අවසන් වර්ෂය සදහා ආදායම් සහ වියදම් ගිණුම**

| ආදායම 2016 නැවත ප්‍රකාශිත රු.ශත | සටහන් | කෝඩ් අංක 1 | කෝඩ් අංක 2 | කෝඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තරය | ගිණුම් සටහන් | ආදායම් 2017 රු. ශත | ආදායම 2017 රු. ශත |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ආදායම් | | | |
| 10,834,650.14 | 09 | 020 | 000 | 00 | ආයෝජන මත පොලී | 04 | 14,792,802.70 | |
| 37,404,670.00 | | 041 | 000 | 00 | ආදායම් - ජාතික ලොතැරයි මණ්ඩලය | 06 | 24,551,128.97 | |
| 364,600.00 | | 066 | 000 | 00 | ගෙවීම් ආපසු ලැබීම් | 01 | 185,186.50 | |
| 10,000,000.00 | | 001 | 000 | 00 | ප්‍රදාන | | 19,500,000.00 | |
| | | 060 | 000 | 00 | විවිධ තැන්පතු | | | |
| 3,506.84 | | 066 | 000 | 00 | වෙනත් ආදායම් | | 1.00 | |
| | | 065 | 000 | 00 | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය | | 5,158,385.22 | |
| | | 020 | 000 | 00 | ආයෝජන අදායම ගැලපීම | | 4,278.35 | |
| 58,607,426.98 | | | | | මුළු ආදායම | | | 64,191,782.74 |
| | | | | | | | | |
| | | | | | වියදම් | | | |
| | | 023 | 000 | 00 | දේශීය තරග සදහා මුදල් | | | |
| 360,000.00 | | 026 | 000 | 00 | පරිපාලන වියදම් | | 657,677.00 | |
| 370,700.00 | | 028 | 000 | 00 | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | | 733,311.40 | |
| | | 029 | 000 | 00 | වාර්තාකරුවන්ගේ විදේශ සංචාර | | 83,500.00 | |
| 6,215,000.00 | | 033 | 000 | 00 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | | 20,400,000.00 | |

| ආදායම 2016 නැවත ප්‍රකාශිත රු.ශත | සටහන් | කෝඩ් අංක 1 | කෝඩ් අංක 2 | කෝඩ් අංක 3 | ගිණුමේ නම සහ විස්තරය | ගිණුම් සටහන් | ආදායම් 2017 රු. ශත | ආදායම 2017 රු. ශත |
|---|---|---|---|---|---|---|---|---|
| | | 040 | 035 | 00 | ක්‍රීඩා සමාජ | | 381,500.00 | |
| | | 040 | 035 | 00 | මාතර දිස්ත්‍රික් මළල ක්‍රීඩා සංගමය | | 200,000.00 | |
| | | 040 | 035 | 00 | ශ්‍රී ලංකා ජිම්නාස්ටික් සංගමය | | 504,000.00 | |
| 750,000.00 | | 040 | 035 | 00 | ශ්‍රී ලංකා පාසල් රග්බි පාපන්දු සංගමය | | | |
| 150,000.00 | | 040 | 035 | 00 | සමස්ථ ලංකා කරාතේ සංගමය | | | |
| 15,000.00 | | 037 | 000 | 00 | ක්‍රීඩකයින් සදහා වෛද්‍යාධාර | | 1,050,000.00 | |
| 95,815,850.01 | | 038 | 000 | 00 | ක්‍රීඩකයින් සදහා උපහාර | | 24,185,500.00 | |
| 429,926.03 | | 021 | 000 | 00 | ජාත්‍යන්තර තරග | | 32,500.00 | |
| 360,000.00 | | 043 | 000 | 00 | විගණන ගාස්තු ගෙවීම | | 180,000.00 | |
| 7,294,500.00 | | 046 | 004 | 00 | ජාතික ක්‍රීඩා උළෙලට ගෙවීම් | | 8,796,050.00 | |
| 6,249,365.18 | | 047 | 000 | 00 | විවිධ ගෙවීම් | | 8,122,633.00 | |
| 600,000.00 | | 027 | 002 | 00 | වෙනත් දීමනා | | 600,000.00 | |
| 700,000.00 | | 063 | 001 | 00 | ජනාධිපති සම්මාන | | | |
| | | 065 | 002 | 00 | ඉන්ධන අත්තිකාරම් | | 6,000.00 | |
| | | 065 | 004 | 00 | විවිධ අත්තිකාරම් | | 214,809.10 | |
| | | 065 | 001 | 00 | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණය | | 3,868,907.72 | |
| 119,310,341.22 | | | | | මුළු වියදම | | | 70,016,388.22 |
| (60,702,914.24) | | | | | අතිරික්තය | | | (5,824,605.48) |

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2017.12.31 දිනට ශේෂ පත්‍රය

.

| කෝඩ් අංක 1 | කෝඩ් අංක 2 | කෝඩ් අංක 3 | සටහන් | ගිණුමේ නම සහ විස්තරය | ගිණුම් සටහන් | 2016 නැවත ප්‍රකාශිත රු. ශත | 2017 රු. ශත |
|---|---|---|---|---|---|---|---|
| | | | | වත්කම් | _ | | |
| 050 | 000 | 00 | | මුදල් ශේෂය | | 11,860,219.49 | 7,003,260.02 |
| | | | 09 | ලැබිය යුතු විශේෂ අත්තිකාරම් | | | - |
| | | | | විවිධ ණය ගැතියෝ | 03 | 16,225,181.22 | 14,747,288.58 |
| | | | | | | 28,085,400.71 | 21,750,548.60 |
| | | | | ජංගම නොවන වත්කම් | _ | | |
| | | | 09 | ආයෝජන ගිණුම | | 138,157,642.19 | 142,760,514.45 |
| | | | | | | | |
| | | | | මුළු වත්කම් | | 166,243,042.90 | 164,511,063.05 |
| | | | | බැරකම් | _ | | |
| | | | | ජංගම බැරකම් | _ | | |
| 060 | 000 | 00 | | විවිධ තැන්පත් | 08 | 75,000.00 | 3,327,564.00 |
| 018 | 000 | 00 | | උපචිත වියදම් | 07 | 390,000.00 | 1,230,061.63 |
| | | | | වෙන්කිරීම් | | 465,000.00 | 4,557,625.63 |
| | | | | ජංගම නොවන බැරකම් | _ | | |
| | | | | මුළු බැරකම් | | 465,000.00 | 4,557,625.63 |
| | | | | ශුද්ධ වත්කම් | | 165,778,042.90 | 159,953,437.42 |
| | | | | | | | |
| | | | | ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| 002 | 000 | 00 | 09 | සමුච්චිත අරමුදල | 11 | 165,778,042.90 | 159,953,437.42 |
| | | | | | | | |
| | | | | මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය | | 165,778,042.90 | 159,953,437.42 |

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | මුදල | මුදල |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් | | |
| | | |
| වර්ෂයේ අතිරික්තය | (5,824,605.48) | (5,824,605.48) |
| | | |
| මුදල් නොවන වෙනස්වීම | | |
| | | |
| ණය ගැතියෝ අඩුවීම | 1,477,892.64 | |
| විවිධ තැන්පතු වැඩිවීම | 3,252,564.00 | |
| විවිධ ණය හිමියෝ වැඩිවීම | 840,061.63 | |
| | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය | | |
| | | |
| ස්ථාවර තැන්පත් වැඩිවීම | 4,602,872.26 | |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම | | (4,856,959.47) |
| කාලච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | | 11,860,219.49 |
| කාලච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | | 7,003,260.02 |

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සදහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| **2016 නැවත ප්‍රකාශිත රු. ශත** | **සටහන්** | **ගිණුමේ නම සහ විස්තරය** | **2017 රු. ශත** |
|---|---|---|---|
| | | | |
| 226,480,957.14 | 09 | 2017.01.01 දිනට සමුච්චිත අරමුදල | 165,778,042.90 |
| | | | |
| | | | |
| (60,702,914.24) | | 2017 වර්ෂයේ ඌණතාවය | (5,824,605.48) |
| | | | |
| **165,778,042.90** | | **2017.12.31 දිනට සමුච්චිත අරමුදල** | **159,953,437.42** |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය - සීඒ එස්/ඒ/එන් එස් එෆ්/6/7/11 2018.10

ලේකම්,
ක්‍රීඩා අමාත්‍යාංශය

**ජාතික ක්‍රීඩා අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය සහ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25(4) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික ක්‍රීඩා අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳව ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 02. මූල්‍ය ප්‍රකාශන

--------------------

## 2.1 මතය

---------

මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

### 2.2.1 පැහැදිලි නොකළ වෙනස්කම්

-------------------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයේ ආදායම රු. 5,158,385 ක් වූ අතර ක්‍රීඩා සංකීර්ණයේ ව්‍යාපෘති කළමණාකරු විසින් අමාත්‍යාංශය වෙත එවන ලද ආදායම් බැර කිරීමේ විස්තර ඇතුළත් මාසික වාර්තා අනුව ආදායම් එකතුව රු. 5,083,640 ක් වූයෙන් රු. 74,745 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------------

1973 අංක 25 දරන ජාතික ක්‍රීඩා පනතේ 25(2) වගන්තිය ප්‍රකාර අමාත්‍යාංශයේ ලේකම් විසින් එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මණින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් පිළියෙළ කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා එවැනි වාර්තාවක් පිළියෙළ කර නොතිබුණි.

# 03. මූල්‍ය සමාලෝචනය

-----------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 5,824,605 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 60,702,914 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 54,878,309 ක ඌනතාවයේ අඩුවීමක්

නිරීක්ෂණය විය. ක්‍රීඩකයින් සඳහා උපහාර උළෙලේ වියදම් රු. 71,630,350 කින් අඩු වීම, ආයෝජන මත පොලී රු. 3,958,153 කින් වැඩි වීම, දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 1,289,478 ක ශුද්ධ ආදායමෙන් ලැබීම සහ ප්‍රදානයන් රු. 9,500,000 කින් වැඩි වීම ඉහත ඌනතාවයේ අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 04. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්ය සාධනය

--------------------

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා වලට ධෛර්ය දීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම අරමුදලේ ප්‍රධාන අරමුණ වූ අතර ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 22 වගන්තියෙන් ඒ සඳහා ක්‍රීඩා අරමුදලට නීතිමය ප්‍රතිපාදන සලසා තිබුණි. 2007 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ජාතික ක්‍රීඩා අරමුදල ක්‍රියාත්මක විය. එහෙත් 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25 (1) වගන්තිය ප්‍රකාරව අරමුදල පරිපාලනය සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

### 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------------

2005/2006 සාක් ක්‍රීඩා උළෙලේ පිහිනුම් සංචිතයේ පුහුණු කිරීම වෙනුවෙන් යැයි කරුණු දක්වමින් පෞද්ගලික පිහිනුම් පුහුණුකරුවෙකු වෙත ජාතික ක්‍රීඩා අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 4 ක් ගෙවා තිබුණද එම ගෙවීමේ නීත්‍යානුකූලභාවය තහවුරු කිරීම සඳහා අමාත්‍යාංශය සහ පුහුණුකරු අතර ඇති කරගත් ගිවිසුම, අදාළ වියදම් වාර්තාව, බිල්පත් ඉන්වොයිස් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 4 ක් ඇතුළුව රු. මිලියන 5.3 ක මුළු වියදමෙන් රු. මිලියන 1.3 ක් 2012 වර්ෂයේදී මේ ආකාරයෙන්ම එම පුහුණුකරු වෙත ගෙවා තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

## 05. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

----------------------------

ජාතික ක්‍රීඩා අරමුදල සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 64 ක ආදායමක් හා අරමුදල් වියදම රු. මිලියන 70 ක් වූ අතර අරමුදල සතුව සමාලෝචිත වර්ෂය අවසාන

දිනට පැවති වත්කම්වල එකතුව රු. මිලියන 164 ක් විය. ඒ අනුව මු.රෙ 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක විය යුතු වූ නමුත් අරමුදල සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද ජාතික ක්‍රීඩා අරමුදලේ විගණන කටයුතු එම අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සිදු කිරීමට අවධානය යොමු කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------------

අයවැය ගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා සැසඳීමේදී විෂයයන් 11 කට අදාළව සියයට 14 සිට සියයට 100 දක්වා විචලයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරණ පාලන කාරණයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 06. පද්ධති හා පාලනයන්

--------------------------

විගණනයේදී නිරීක්ෂනය වූ පද්ධති හා පාලන අඩුපාඩු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අයවැය පාලනය | අයවැය ගත ආදායම් හා වියදම් තත්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් පැවතීම. |
| (ආ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයන් සිදු කර නොතිබීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති